ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

**කොළඹ**

## පුවත්පත් නිවේදනය

**කෘෂි තාක්ෂණය පිළිබඳ දැනුම බෙදා හදා ගනිමින් ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය උතුරු සහ මධ්‍යම පළාතේ කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා රෝවර් කෘෂි යන්ත්‍රෝපකරණ භාවිතා කරන ආකාරය පිළිබඳ ඉදිරිපත් කිරීම් සඳහා පහසුකම් සපයයි**

කෘෂිකර්මාන්තය විප්ලවීයකරණය කිරීමේ ශ්‍රී ලංකා රජයේ ප්‍රයත්නයන් හා සමගාමීව මහනුවර සහකාර ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය සහ යාපනය ඉන්දිය කොන්සියුලර් ජනෙරාල් කාර්යාලය විසින් ඉන්දියාවේ මකේක්රියේෂියෝ ඉන්ඩස්ට්‍රියල් සොලියුෂන්ස් පුද්ගලික සමාගමට අයත් සන්නාමයක් වන රෝවර් (RoWeR) වෙතින් පිරිනමන උසස් කෘෂිකාර්මික යන්ත්‍රයෙහි සජීවී ඉදිරිපත් කිරීම් සඳහා පහසුකම් සපයන ලදී.

2. මෙම ඉදිරිපත් කිරීම් මධ්‍යම පළාතේ REDA, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සිංහ සමාජය, කාන්තා වාණිජ මණ්ඩලය සහ වෙනත් ආයතන හා එක්ව මහනුවර, මාතලේ, නුවර එළිය සහ බදුල්ල යන ප්‍රදේශයන්හි විවිධ ස්ථානවල පවත්වන ලදී.

3. ඉන් අනතුරුව මෙම කණ්ඩායම ඉන්දිය කොන්සියුලර් ජනෙරාල් කාර්යාලය විසින් යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිකාර්මික පීඨයේ සහ යාපනය පළාලි පාරේ නියෝජ්‍ය පළාත් කෘෂිකාර්මික අධ්‍යක්ෂ කාර්යාල පරිශ්‍රයන්ගේ සංවිධානය කර තිබූ වැඩසටහන් හි ඉදිරිපත් කිරීම් සිදු කළේය.

4. මෙම වැඩසටහන සඳහා විශ්ව විද්‍යාලයේ විවිධ කෘෂිකාර්මික අධ්‍යයන විෂයමාලාවන් හි ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 50 දෙනෙකුට අධික පිරිසක් ද මධ්‍යම, ඌව සහ උතුරු පළාතේ ගොවියන් 200 දෙනෙකුට අධික පිරිසක් ද මහත් උනන්දුවකින් සහභාගී වූහ. කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික ක්ෂේත්‍ර නිලධාරීන් සහ සම්පත් දායකයන් මෙම වැඩසටහටනට සහභාගී වී කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නිර්මාණය කර ඇති නවතම රෝවර් සීඩර් (seeder) යන්ත්‍ර සහ වෙනත් අති නවීන යන්ත්‍රෝපකරණ පිළිබඳ වටිනා අත්දැකීමක් ලබා ගත්හ. මෙම මුලපිරීම් දේශීය ගොවියන්ගේ සහ කෘෂිකර්මාන්තයේ නිරත වෘත්තිකයන්ගේ දැනුම සහ කුසලතා ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට සහය වීම සඳහා ඉන්දියාවේ කැපවීම අවධාරණය කරයි.

***

කොළඹ

2024 දෙසැම්බර් 23